මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PE/2024/16 2024.10.09

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14
## තැපෑලෙන් ඡන්දය දීමට අපේක්ෂිත ඡන්දහිමියන් වෙත කෙරෙන විශේෂ නිවේදනයයි.

2024 පාර්ලිමේන්තු මැතිවරණයේ තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2024.10.10 දින මධ්‍යම රාත්‍රි 12.00ට අවසන් වීමට නියමිත වේ.

මැතිවරණ රාජකාරීවලින් නිදහස් කර ඇති අය හැර රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ අනෙකුත් සියලුම නිලධාරීන් තැපැල් ඡන්ද ඉල්ලුම් කළ යුතු අතර තැපැල් ඡන්ද අයදුම්කර නොතිබීම මෙන්ම අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබීම ද මැතිවරණ රාජකාරීවලින් නිදහස් කිරීමට හේතුවක් නොවේ. එබැවින් සුදුසුකම් ඇති සියළුම තැපැල් ඡන්දහිමියන්ගේ ඉල්ලුම්පත් 2024.10.10 දින මධ්‍යම රාත්‍රි 12.00ට පෙර තම සේවස්ථානයට ආසන්නතම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු බව දැනුම් දෙමි.

මැතිවරණ රාජකාරි සඳහා වාර්තා කරන  ලෙස පත්වීම් ලිපි ලැබෙන සියලුම නිලධාරීන් අදාළ මැතිවරණ රාජකාරියට වාර්තා කළ යුතු අතර මැතිවරණ රාජකාරී  අවසානයේ තමන්ගේ නිත්‍ය සේවා ස්ථානයට වාර්තා කිරීමෙන් පසුව පැමිණීමේ සහතිකය ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

මැතිවරණ රාජකාරී සඳහා වාර්තා නොකරණ නිලධාරීන්/ සේවකයින්  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උ.උ.  ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව සමග සහයෝගයෙන් කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන හෝ අපොහොසත්වන තැනැත්තන් ලෙස සැලකේ. මේ අයුරින් ක්‍රියා කිරීම රුපියල් ලක්ෂයක දඩයක් හෝ/ සහ වසර 03ක් දක්වා සිරදඬුවම් ලැබිය හැකි වරදක් වන බව සඳහන් කරණු කැමැත්තෙමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්